# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1887/39 - 2014 නොවැම්බර් මස 07 වැනි සිකුරාදා - 2014.11.07

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 277/40.

(188 වැනි අධිකාරය වූ) පුරාවස්තු ආඥාපනත

33 වැනි වගන්තිය යටතේ වූ නිවේදනය

(188 වැනි අධිකාරය වූ) පුරාවස්තු ආඥාපනතේ 33 වැනි වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල් දිසානායක මුදියන්සේලාගේ සෙනරත් බණ්ඩාර දිසානායක වන මා විසින් එකී වගන්තියේ විධිවිධානවලට අනුකූල වී ඇති බවට සෑහීමකට පත්වීමෙන් පසු මේ නිවේදනය මගින් මෙහි උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති රජයේ ඉඩම් කොටස ඉහත කී ආඥාපනතේ කාර්යය සඳහා පුරාවිද්‍යාත්මක කටයුතු සඳහා වෙන් කළ භූමිය වශයෙන් සලකනු ලැබිය යුතු බවට ප්‍රකාශයට පත්කරනු ලැබේ.

සෙනරත් දිසානායක,
පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල්.

2014 නොවැම්බර් මස 05 වැනි දින,
කොළඹ දී ය.

### උපලේඛනය

විල්ගම් වෙහෙර සෝමාවතී රජමහා විහාරය, පුරාවිද්‍යාත්මක කටයුතු සඳහා වෙන්කළ භූමියක් ලෙස ප්‍රකාශයට පත්කරනු ලබන ඉඩම පිළිබඳ විස්තරය :-

නැගෙනහිර පළාතේ, ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ, සේරුවිල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, සේරුවිල ග්‍රාම නිලධාරී වසමේ පිහිටි අක්කර 49, රූඩ් 3, පර්චස් 21ක විශාලත්වයෙන් යුත් අංක 22 දරන භූ ලක්ෂණ මූලික පිඹුරේ පෙන්නුම් කර ඇති අවසාන ගම් පිඹුරේ ලොට් අංක 415 (බහාලු අතිරේක පිටු අංක 29) වශයෙන් පෙන්නුම් කර ඇති විල්ගම් වෙහෙර සෝමාවතී රජමහා විහාරය පුරාවිද්‍යාත්මක කටයුතු සඳහා වෙන්කළ භූමිය වශයෙන් හඳුන්වනු ලබන ඉඩම් කොටස.

11-602